# යහළුවෝ ( 23 වන පාඩම )

## සිංහල භාෂාව හා සාහිත්‍ය - 7 ශ්‍රේණිය

වයි. වි. ජී. කේ. සේනාරත්න මෙය.
ර/බල/කෝන්ගහමංකඩ විද්‍යාලය, බලංගොඩ.



- කොහොමද යාළුවනේ, මගේ නම ලකිදූ.මම ඉන්නේ 7 ශ්‍රේණියේ.

- මගේ නම චතුමි.මම ඉගෙන ගන්නෙත් 7 ශ්‍රේණියේ.





ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම් මහතා

අපි දෙන්නා අද ඔයාලට ඉදිරිපත් කරන්න යන්නේ, ලංකාවේ බෞද්ධ පාසල් රැසක් ආරම්භ කිරීමට පුරෝගාමී වූ ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම් මහතා පිළිබඳවයි.



# අදිකාරම් තුමාගේ ජීවන හා අධ්‍යාපනික තොරතුරු

හොඳයි යාළුවනේ, අපි එහෙනම් බලමු කවුද අදිකාරම් මහතා කියන්නේ කියලා.



ක්‍රි .ව. 1905 මාර්තු 29 වන දින වැල්ලම්පිටිය, කිත්තම්පහුව නම් ගම්මානයේ උපත ලද මෙතුමා, අධ්‍යාපනය ආරම්භ කළේ කොළඹ වෙස්ලි විදුහලෙන්. පාසල් අධ්‍යාපයන තුළ කැපී පෙනෙන ශිෂ්‍යයෙකු වූ මෙතුමා වැඩිදුර අධ්‍යාපනය සඳහා කොළඹ යුනිවර්සිටි කොලිජියට ඇතුළත් වුණා. ඒ 1922 වර්ෂයේ දී අධ්‍යාපනයට දැක් වූ දක්ෂතාව හේතුවෙන්. අධිකාරම් තුමාට 1930 වර්ෂයේ දී ලන්ඩන් විශ්ව විද්‍යාලයට ඇතුළත් වීම සඳහා ශිෂ්‍යත්වයක් හිමි වුණා. එහිදි පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය නමැති නිබන්ධය සඳහා ආචාර්ය උපාධිය ලබා ගත්තා.





අපි දැන් බලමු
අදිකාරම් තුමා විසින්
අධ්‍යාපනික කටයුතු
සඳහා කරන ලද
සේවාවන් මොනවාද
කියලා.

- බෞද්ධ පාසල් රැසක් ආරම්භ කිරීම.

උදා : අනුලා විදුහල ( නුගේගොඩ )

ආනන්ද බාලිකා විදුහල ( කෝට්ටේ )

ආනන්ද ශාස්ත්‍රාලය (මතුගම )

විද්‍යාකර විදුහල (මහරගම )

නිග්‍රෝධ විදුහල (ගංගොඩවිල ) ආදි බෞද්ධ පාසල් ගණනාවක් පිහිටුවීමට මූලිකත්වය ලබා දීම.

- විද්‍යාව සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීම සඳහා පාරිභාෂික ශබ්ද මාලාවක් සම්පාදනය කිරීම .
- සිංහල මාධ්‍යයෙන් දරුවන්ට විද්‍යාව හැදෑරීම සඳහා අවශ්‍ය කරන විද්‍යා පොත්පත් , විද්‍යා සඟරා ප්‍රකාශයට පත් කිරීම. පුවත්පත්වලට ලිපි ලිවීම හා ගුවන්විදුලි මාධ්‍යයෙන් කතා පැවැත්වීමෙන් දරුවන්ගේ අධ්‍යාපනය දිරිමත් කිරීම.
- ශිෂ්‍ය විනය සංවර්ධනය කිරීමේ දී අවිහිංසා සිතුවිලි පදනම් කර ගැනීම.



අපේ සිංහල පෙළ පොතේ 23 වන පාඩමට ඇතුළත් වෙලා තියෙන්නේ ඒ. ඩබ්ලිව්. අදිකාරම් තුමා විසින් රචිත සිතුවිලි සඟරාවේ, 41 වන කාණ්ඩයෙන් උපුටා ගත් ලිපියක්. ඒ ලිපියේ සඳහන් වන තොරතුරු පිළිබඳ චතුම් ඔයාලට පැහැදිලි කරයි.



- පුංචි අපි හැමදෙනාටම යහළුවන් සිටියි. ඇතැම් අය අසල්වැසියන් හෝ පන්තියේ සිටින අය විය හැකිය.
- මෙය පිළිබඳ සොයා බැලීමට කුඩා වඳුරු පැටවුන් යොදාගෙන පර්යේෂණයක් සිදු කර ඇත.
- මෙම පර්යේෂණය සඳහා වඳුරු පැටවුන් යොදාගෙන සිදු කර ඇත්තේ මිනිසාට කිට්ටු සම්බන්ධකම් ඇති සත්වයෙක් නිසාය.
- මෙම පර්යේෂණයෙන් හෙළිවුන කරුණක් වනුයේ, මිතුරු ඇසුර පැවති වඳුරු පැටවුන් ලොකු වූ විට වඳුරු සිරිත් විරිත් දන්නා, වඳුරු සමාජයට හොඳින් ගැලපුන බවත්, මිතුරු ඇසුර නොලද වඳුරු පැටවුන් ලොකුවන විට මේ කිසිදු ලක්ෂණයක් නොදන්නා බවයි.
- “මෛත්‍රී” යන වචනය සෑදී තිබෙන්නේ ද “මිත්‍ර” යන්නෙනි. එබැවින් කළණ මිතුරාගේ ස්වරූපය මෛත්‍රියයි..
- එහෙත් හොඳ මිතුරන් සමාජයේ අතිශයින් ම දුර්ලභය.



- දෙමව්පියන් හා ගුරුවරුන් තම දරුවන් වෙනුවෙන් සිදු කළ හැකි ලොකුම සේවය වනුයේ, බාහිර සමාජයෙන් සිදු වන කරදර උපද්‍රවයන්ගෙන් හා නරක/පාප මිතුරන්ගෙන් දරුවා ආරක්ෂා කර ගැනීමයි.

- පැරණි පොතක සඳහන් වන අන්දමට බ්‍රහ්ම චර්යාව යනු උතුම්/උසස් හැසිරීම යන්නයි. අප මහ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ද බ්‍රහ්ම චර්යාව කල්‍යාණ මිත්‍රත්වයට උපමා කර ඇත.

- ඒ අනුව අපට පැහැදිලි වනුයේ මිතුරුකම යනු උතුම් දෙයක් වන බවය.



මෙයට අමතරව
එතුමා අතින් සිදු වූ
තවත් සේවාවන්
රැසක් අපට හඳුනා
ගන්න පුළුවන්.



- නිරන්තරයෙන් සාමය අගය කළ අදිකාරම්තුමා ජාති, ආගම් හා පන්ති භේද පිළිබඳ සැලකිල්ලට නොගැනීම.
- සාමකාමී ලොවක් ගොඩනැගීම සඳහා කැපවීමෙන් කටයුතු කිරීම.
- එම උදාර කැපකිරීම වෙනුවෙන් අදිකාරම්තුමාට ක්‍රි. ව. 1980 දී එක්සත් ජාතීන්ගේ සංගමයේ ශ්‍රී ලංකා ශාඛාව විසින් ප්‍රථම වරට සාම ත්‍යාගය පිරි නැමීම.
- එයින් ලැබුණු රුපියල් දස දහසක් වටිනා චෙක්පත සාම කටයුතු සඳහා යොදා ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථානයට පරිත්‍යාග කිරීම.



අදිකාරම්තුමා සතුන් කෙරෙහි දැක් වූ ආදරය, කරුණාව පිළිබඳ හෙළිවන හරි අපූරු කතන්දරයක් තියෙනවා. අපේ 7 වසර යාළුවන්ටත් ඒ කතාව කියමු නේද ලකිදු




- ඔව් චතුමි. දවසක් අදිකාරම්තුමා මෝටර් රථයෙන් පාගොඩ ප්‍රදේශයේ සිට ආනන්ද ශාස්ත්‍රාලයට යන විට ඉදිරියේ මහපාර හරහා කළු ඉරක් දුටුවා. එතුමා මෝටර් රථය නතර කර ඒ කුමක් දැයි සොයා බලන විට, කුඹි රැලක් ඉදිරියෙන් ගමන් කරන අයුරු අදිකාරම්තුමාට දැකගන්නට ලැබුණා. මෝටර් රථය පැදවුව හොත් කුඹි සිය ගණනක් මිය යන නිසා, පාර අද්දර නිවසක සිටි අයෙකුට තම මෝටර් රථය බලාගන්න යැයි කියා පාසලට පා ගමනින් ගියේ, සතුන් කෙරෙහි දැක්වූ ආදරය හා කරුණාව නිසාය.




ඉතින් යාළුවනේ, යහපත්
සදාචාර සම්පන්න මිනිස්
පරපුරක් බිහි කිරීම
වෙනුවෙන් ජීවිතයේ වැඩි
කාලයක් ගත කළ ඊ.
ඩබ්ලිව්. අදිකාරම්තුමා සතුව
පැවති යහපත් ගුණාංග,
අපේ ජීවිතය සාර්ථක කර
ගැනීමට උපකාරි කර ගනිමු.



# අදිකාරම්තුමා විසින් රචිත නිබන්ධය සහ සඟරාවක්






- අදිකාරම්තුමා පාසල් දරුවන් වෙනුවෙන් කරන ලද සේවාවන් කවරේ ද?
- එතුමා විසින් ආරම්භ කරන ලද බෞද්ධ පාසල් කීපයක් සඳහන් කරන්න.
- මෙම පාඩම උපුටාගත් සඟරාවේ නම කුමක් ද?
- මෙම ලිපියේ සඳහන් වන්නේ කුමක් පිළිබඳව ද?
- පාඩමේ සඳහන් වන ආකාරයට පර්යේෂණය සඳහා යොදා ගෙන ඇත්තේ කවුරුන් ද?
- එම පර්යේෂණයෙන් නිගමනය වූයේ කුමක් ද?
- දෙමව්පියන් සහ ගුරුවරුන් විසින් දරුවන් වෙනුවෙන් කළ හැකි ලොකුම සේවය කුමක් ද?
- පාඩමේ දැක්වෙන පරිදි බ්‍රහ්ම චරියාව යනු කුමක් ද?
- බුදු රජාණන් වහන්සේ  මිතුරුකම උපමා කර ඇත්තේ කුමකට ද?
- අදිකාරම්තුමා සතුන්ට දැක්වූ ආදරය, කරුණාව පිළිබඳ දැක්වෙන කතාව ලියන්න.